ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
දිනය 2013/01/31

## 2013 ජනවාරි මාසයේ දී උද්ධමනය ඉහළ නගී.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2012 දෙසැම්බර් මාසයේ පැවති සියයට 9.2 හි සිට 2013 ජනවාරි මාසයේ දී සියයට 9.8 දක්වා ඉහළ නැගිණි. දිවයිනේ පැවති අහිතකර කාලගුණික තත්ත්වයන් නිසා සිදුවූ වගා හානි සහ සැපයුම් බාධාවන් හේතුවෙන් ඇතැම් ආහාර වර්ගවල මිල ගණන් ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතිකය ද පූර්ව මාසයේ පැවති සියයට 7.6 හි සිට 2013 ජනවාරි මාසයේ දී සියයට 8.1 දක්වා ඉහළ නැගිණි.

කෙසේ වුවද, ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය 2012 දෙසැම්බර් මාසයේ පැවති සියයට 7.6 හි සිට 2013 ජනවාරි මාසයේ දී සියයට 7.3 දක්වා පහළ වැටුණු අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2012 දෙසැම්බර් මාසයේ පැවති සියයට 5.8 හි සිට 2013 ජනවාරි මාසයේ දී සියයට 6.1 දක්වා ඉහළ නැගිණි.




කො.පා.මි. දර්ශක අගය 2012 දෙසැම්බර් මාසයේ දී පැවති 168.6 හි සිට 2013 ජනවාරි මාසයේ දී 170.0 දක්වා නිරපේක්ෂ වශයෙන් වැඩි වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 0.8 කින් ඉහළ නැගිණි. ආහාර කාණ්ඩයේ මිල ගණන් සියයට 1.3 කින් වැඩි වීම දර්ශකයේ මෙම මාසික ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. බොහෝ එළවළු වර්ග, නැවුම් මත්ස්‍ය, කරවල, රතු ළූණු, පොල්, සහ සමහර පළතුරු වර්ගවල මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය. කෙසේ වුවද, බිත්තර සහ අර්තාපල් මිල ගණන්හි පහළ යාමක් වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ ප්‍රවාහන (සියයට 0.8 කින්); නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 0.5 කින්); රෙදිපිළි හා පාවහන් (සියයට 0.1 කින්) සහ සෞඛ්‍යය (සියයට 0.1 කින්) යන උප කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ නැගිණි. පෙට්‍රල් සහ එල්.පී. ගෑස් මිල ඉහළ නංවමින් මෑතදී සිදු කළ සංශෝධන ප්‍රවාහන; සහ නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන යන උප කාණ්ඩයන්හි ඉහළ නැගීමට හේතු විය. මේ අතර, ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; අධ්‍යාපන සහ විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.